PR/2018/22-S

# ජපන් තානාපති කාර්යාලය

නො.20 ශ්‍රීමත් ආර්.පී.සේනානායක මාවත, කොළඹ 07

දුරකථනය: 94-11-269-3831~3, ෆැක්ස්: 94-11-269-8629
ඊ-මේල: cultujpn@sltnet.lk

අගෝස්තු 01, 2018

## පුවත්පත් නිවේදනය

**මූල්‍ය කටයුතු අධ්‍යයනය සඳහා වු විද්‍යායතනයේ පුහුණු ධාරිතාවය වැඩි දියුණු කිරීමේ ව්‍යාපාතියට ජපානයෙන් තවදුරටත් ආධාර.**

ජපන් රජය මගින් ශ්‍රී ලංකා රජයේ ඉල්ලීමට ප්‍රතිචාරයක් ලෙස, ලංකාවේ මූල්‍ය කටයුතු අධ්‍යයනය සඳහා වු විද්‍යායතනය හරහා ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය කටයුතු සම්බන්ධ ධාරිතා සංවර්ධන වැඩසටන තවත් වසර දෙකකින් දීර්ඝ කිරීමට තීරණය කර ඇත. ඒ අනුව මෙම කාල පරිච්ඡේදය තුලදී ඒ සඳහා යොදාගනු ලබන අරමුදල් ප්‍රමාණය දළ වශයෙන් රුපියල් මිලියන 111කි.

මෙම වැඩසටහනෙහි අරමුණ වන්නේ, මුදල් අමාත්‍යාංශයේ පුහුණු අංශය වන මූල්‍ය කටයුතු අධ්‍යයනය සඳහා වු විද්‍යායතනය විසින් 2013 ජනවාරි මාසයේ සිට ආරම්භ කරන ලද එම ආයතනයේ ධාරිතා සංවර්ධන වැඩසටහන් ආයතනගත කිරීම හා වැඩිදියුණු කිරීමයි.

ශ්‍රී ලංකාව ඉහල මධ්‍යම ආදායම් සහිත ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීමේදී රාජ්‍ය අංශයේ ආයතන වල ධාරිතා ප්‍රවර්ධනය අතිශය වැදගත් කාර්යක් වන බවට ජපානය සලකනු ලැබේ.

2014 වසරේදී මෙම වැඩසටහන සඳහා වූ ප්‍රථම මූල්‍ය ආධාරය අනුමත කිරීමේ සිට රාජ්‍ය අංශයේ නිශ්චිත වැදගත්කමක් උසුලන ක්ෂේත්‍රයන් සඳහා ජපානය හා ශ්‍රී ලංකාව අතර විද්වතුන් හුවමාරුව ස්ථාපනය කිරීම, සම්මන්ත්‍රන සංවිධානය කිරීම, දැණුම ලබාදීම ආදී වැදගත් කාර්යයන් ගණනාවක් මූල්‍ය කටයුතු අධ්‍යයනය සඳහා වු විද්‍යායතනය මගින් සිදුකර ඇත. එසේම මෙම ආයතනය විසින් රාජ්‍ය අංශයේ නිලධාරින්ට ඔවුන්ගේ සේවය වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී අයුරින් ඉටු කිරීම සඳහා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් ද සංවිධානය කර ඇත. මූල්‍ය කටයුතු අධ්‍යයනය සඳහා වු විද්‍යායතනය මගින් පසුගිය වසර දෙකහමාර තුල මුදල් අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතනයන්හී රාජ්‍ය අංශයේ විවිධ ධාරාවන්හි නිලධාරින් විශාල සංඛ්‍යාවක් සඳහා පුහුණුව හා ධාරිතා ඉහල නැංවීමේ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත. මෙම මූල්‍ය ප්‍රදානය තුලින් මුදල් අමාත්‍යාංශය හා වෙනත් ප්‍රමුඛ ආයතනයන් හි 33000 කට අධික රාජ්‍ය අංශයේ නිලධාරි පිරිසක් ප්‍රතිලාබ ලබාගෙන ඇත.

මූල්‍ය කටයුතු අධ්‍යයනය සඳහා වු විද්‍යායතනයට වඩා හොඳ පහසුකම් සපයාදීම මගින් එහි ධාරිතා වර්ධනය කිරීමෙන් මෙරට ආයෝජන දිරිගැන්වීම හා ආර්ථික සංවර්ධනය කෙරෙහි අවශ්‍ය වන්නා වූ සැලසුම් සැකසීම, යෝජනා ඉදිරිපත් කිරීම, එම ව්‍යාපෘති ආරම්භ කිරීම, ඒවා ඇගයීම ආදී විවිධ අංශ සඳහා ආධාර කිරීමත්, වැඩිදියුණු කිරීමත් තුළින් ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම මෙන්ම ශ්‍රී ලාංකික ජනතාවට එමගින් ප්‍රතිලාභ ලබාදීම උදෙසා පුළුල් කාර්යභාරයක් මෙම ඒකාබද්ධ සහාය වැඩසටහන තුලින් සිදූ කල හැකි බව ජපන් රජය අදහස් කරයි. මෙම එකාබද්ධ ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුලදී මෙරට මූල්‍ය ක්ෂේත්‍රයේ කලමනාකරණ මට්ටමේ නිලධාරින් **8500** ක පමණ පිරිසක් සඳහා ලබාදෙන පුහුණුව මගින් විවිධ වැදගත් ක්ෂේත්‍රයන්හි එනම් ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය, මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය, ගිණුම්කරණය, ආදායම් කලමනාකරණය සහ ර්ට අදාල තොරතුරු තාක්ෂණ ක්‍රමවේද ප්‍රගුණ කිරීම මගින් අතිශය වැදගත් ප්‍රතිලාභ අත්කරගැනීමට හැකිවනු ඇත.

මෙම ආධාර වැඩපිළිවෙල පෙරටුකොටගෙන මූල්‍ය කටයුතු අධ්‍යයනය සඳහා වු විද්‍යායතනය ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ දැණුම සහ විශිෂ්ටත්වය පිණිස වූ කේන්ද්‍රය ලෙස පමණක් නොව කලාපීය වශයෙන් පිළිගැනීමක් අත්කර ගැනීමට අඛණ්ඩව ක්‍රියාකාරී වනු ඇතැයි ජපන් රජය සිය විශ්වාසය පළකරයි.(නිමි)

************************************************************

වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න.
සංවර්ධන සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලය
දුරකථනය 011-2693831 (දිගු අංකය 242)